INTRODUCING 1st TIME IN UK

FareDeals Travel & Tours
Fly With Someone You Trust
FareDeals Travel & Tours Ltd.
458, Alexandra Avenue, Rayner's Lane, (Opp:Tube). HA2 9TL. United Kingdom.

- All Deals Available in Colombo Market (in Rupees)
- Cheaper than Leading Agents in Colombo
- We deliver Tickets to your Door Step in Sri Lanka
- No Middlemen, Book Directly with us in London

**Fly to Colombo**

| | |
|---|---|
| Srilankan Air | £ 380 |
| Qatar Air | £ 290 |
| Kuwait Air | £ 260 |
| Oman Air | £ 190 |
| Ethihad Air | £ 350 |

Buy your COLOMBO to LONDON/ UK, Australia, Italy, USA, Tickets. pay in pounds or rupees.

**Fly to London / UK**

| | |
|---|---|
| Srilankan | Rs. 85000* |
| Qatar | Rs. 62000* |
| Kuwait | Rs. 56000* |
| Royal Jor | Rs. 58000* |

Student Offers (o/way)

| | |
|---|---|
| Srilankan | Rs. 42000 |
| Qatar | Rs. 58000* |
| Kuwait | Rs. 41200* |

* Fares subject to taxes/change

Contact - Dulip, Nimesha, Sunirma or Fernando.
Emergency Travel ctc Dulip
0208 150 9183 07551549559
Call us 0800 612 4045 info@faredealtravels.co.uk

ETIHAD AIRWAYS Emirates CATHAY PACIFIC KUWAIT AIRWAYS SriLankan QATAR AIRWAYS



රියෙන්සි අල්ගම

# පක්ෂය වෙනුවෙන් දිවි දුන් මිනිසෙක්

අවුරුදු 29 කටත් වඩා එක්සත් ජාතික පක්ෂයට ලැදිව වැඩකළ පාක්ෂිකයෙකු පසුගිය ජූලි 26 වෙනි දින කොළඹ කෝට්ටේ එජාප ප්‍රධාන කාර්‍යාලය වන සිරිකොත ඉදිරියේදී සිරුරට පැට්‍රල් වත්කර ගෙන ගිනිතබාගෙන ඒ බරපතළ පිළිස්සුම් වලින් පසුදා කොළඹ ජාතික රෝහලේ දී මියගියේය. ඔහු වැලිගම රණමයුරගම පදිංචි 60 වියැති රියෙන්සි අල්ගම නම් තිදරු පියෙකි. ඔහුට දියණියන් දෙදෙනෙකු හා පුතෙකු සිටිති. ලොකු දුව 24 වියැතිය. පුතාට වයස 22 කි. තවම පාසැල් යන බාල දියණිය 16 හැවිරිදිය.

රියෙන්සි පක්ෂයට දැඩිසේ ආදරය කළ මිනිසෙකු වූයේය. ඒ නිසාම වර්තමානයේ එජාප ය තුළ ඇති ගැටුම් හා මතභේද නිසා ඔහු දැඩි ලෙස කම්පාවට හා කළකිරීමට පත්ව සිටිබව ඔහුගේ බිරිඳ හා හිතවත්තු පවසති. ඔහු එජාප නායක රනිල් වික්‍රමසිංහ සහ නියෝජ්‍ය නායක කරු ජයසූරිය හමුවී පක්ෂය කැඩෙන්නට නොදී සමගිවන ලෙස ඉල්ලා සිටි බව ද කියති.

මිය යන්නට පෙර ඔහු පවසා ඇත්තේ තමාගේ ක්‍රියාවේ හේතුවෙන්වත් සමගිවන්නට පක්ෂයේ ලොකු තැන්වලට මොළේ පෑදේවියයි තමා හිතන බවය. කෙසේ හෝ ලෝකයේ දේශපාලන පක්ෂයක් වෙනුවෙන් දිවිනසා ගත් ප්‍රථම පාක්ෂිකයා රියැන්සි අල්ගම බව කිව හැකි ය.

♦ ***කේ. එල්. කරුණාරත්න*** **Sri Lanka**

# ♥ පැටියො ඩාලිං



"පැටියො මේ ඇඳුමෙන් අපිට ඩුබායි අබුඩාබි යන්න නම් හම්බ වෙන්නෙ නෑ..... .."

" අපි එහේ නෙවෙයි නේ යන්නෙ...... හික්කඩුවෙ නේ..... මේක ගැලපෙනවා හික්කඩුවට...... ලොකු නැන්ද ලියලා එවලා තිබුණෙ අනිච්චේ... දුක්කේ... කියලා හිතුනයි කියලා, එහේ වැල්ලේ, **හික්කා 2010** නැටුමට ආපු ඇයින් ඇඳන් හිටපු වස්තර දැකලා. "

# සක්විති සහ ඔහුගේ බිරිඳ අත්අඩංගුවට

**රු**පියල් බිලියනයකටත් එහා මහා පරිමාණයේ මුදල් වංචාවකට සැකකරු ලෙස නම්කරන ලදුව මෙතෙක් අතුරුදහන්ව සිටි සක්විති රණසිංහ සහ ඔහුගේ බිරිඳ වන අනුරාධා ගිය **5** වෙනිදා ලැබුණු ඔත්තුවක් අනුව මිරිහාන පොලීසිය විසින් නවගමුවේ මළ ගෙදරකදී අත්අඩංගුවට ගනු ලැබ ඇත. සක්විති රැවුලක් වවා වෙස්මාරු කරගෙන සිටි බවත් ඔහුත් බිරිඳත් එහි පැමිණියේ ඒ මියගිය ඥාතියාට අවසන් ගෞරවය දැක්වීමට බවත් කියති. ඔහුගේ සමාගමේ ආයෝජකයින් **4000** කට වැඩි සංඛ්‍යාවක් මුදල් තැන්පත් කොට තිබුණි.




Roshan Fernando with
FLASHBACK
FIRST TIME IN LONDON UK
SURENDRA AND AMILA
OPEN LIVE STAGE OUT DOOR MUSICAL EXTRAVAGANZA
25th of September at 6.00 pm
HARROW LEISURE CENTRE
Charistchurch Avenue, London HA3 5BD
Shantha - 07817409520 Sudesh - 07737192123 Kumudu - 0791202862 Sanjee - 07595901588
Main Sponsors: MCG Mike Cooke Group, Strong Safe Reliable; FAST CASH SEND TODAY · COLLECT TODAY
Co-Sponsor: FareDeals Travel & Tours, Fly With Someone You Trust
Electronic media sponsor: www.sesatha.co.uk Minolanka


# Sinhala Lesson 12 සිංහළ පාඩම

## සිංහල ඉගෙනීමට පහසු මගක් !

පහත දැක්වෙන සිංහල අකුරු ශබ්දකරන්නේ ඊට යටින් ඇති ඉංග්‍රිසි වචනයේ ඉරිගසා ඇති කොටස හඬ නැගෙන විධියට බව දරුවන්ට කියා දෙන්න.

The sound of each Sinhala letter corresponds to the underlined part of the English word. Now read aloud the Sinhala letter.

## Vowel Strokes



| | | | | |
|---|---|---|---|---|
| බ | බා | බැ | බෑ | |
| bus / rubber | bar | bat | ban | |
| බි | බී | බු | බූ | බෙ |
| bin | bean | book | boot | bed |
| බේ | බො | බෝ | බ් | |
| bay | bond | bone | cub | |

♦ ආචාර්‍ය සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

# හරස්පද ප්‍රහේලිකා 121

**හරහට :**

1 බුදුබව ලැබූයේ මේ ගස මුලය.
5 පක්ෂි වර්ගයකි.
6 වචන
8 කැලෑවේ ජීවත්වන.
9 අංග විකල තැනැත්තා.
10 තාලය හෝ පපුව යන අරුත.

**පහළට :**

1 උකුළ හෝ තුරුල්ල.
2 ගස් වර්ගයකි.
3 කෂණිකව කියන කවි.
4 දැනෙන දෙයකි.
7 හොඳට එළිය ඇති වෙලාව.
8 ගස් වර්ගයකි.

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | ■ | 4 |
| 5 | | | ■ | |
| | ■ | 6 | 7 | |
| ■ | 8 | | | |
| 9 | | ■ | 10 | |

***ගියවර නිවැරදි විසඳුම්***

**හරහට :** 1 සැකය 5 නිවිති 6 වරද 8 තරබාරු 9 සීමා 10 නවා
**පහලට :** 1 සැනින් 2 කවි 3 යතිවර 4 අතදරුවා 7 රබාන 9 තමා

## නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

# වම්බටු සහ කරවල පැහි
## Brinjal & Dryfish Pehi

***අවශ්‍ය ද්‍රව්‍ය :***

| | |
|---|---|
| ලොකු වම්බටු ගෙඩි | 2 ක් |
| තෝර හෝ බලකරවල කෑලි | 10 ක් |
| බොම්බයි ළූණු ලොකු ගෙඩි | 2 ක් |
| තක්කාලි ලොකු ගෙඩි | 2 ක් |
| අබ තේ හැඳි | 1 ක් |
| සුදුළූණු බික් | 4 ක් |
| රම්පෙ හා කරපිංච | |
| අමු මිරිස් කරල් | 3 ක් |
| ලුණු අවශ්‍ය පමණට | |
| මිරිස් කුඩු තේ හැඳි | 2 ක් |
| විනාකිරි මේස හැඳි | 1 ක් |

***සාදන ක්‍රමය:*** වම්බටු තරමක කැබලිවලට කපා ගැඹුරු තෙලේ බැද තෙල් බේරෙන්නට පසෙක තබන්න. කරවලද වෙනම බැද පසෙක තබන්න. භාජනයකට තෙල් ස්වල්පයක් දමා එහි සිහිනියට ලියන ලද ළූණු, සුදුළූණු, අමුමිරිස් සහ කරපිංචා බැදගන්න. එයට වම්බටු එකතුකර කළවම්කරන්න. අබ, විනාකිරි, ලුණු සහ මිරිස් කුඩු එකට අනා තලපයක් සාදාගන්න. දැන් ඒ තලපයද, කරවලද, වම්බටු වලට එකතුකර සියල්ල හොඳින් කළවම් කරන්න. අවසානයේ තක්කාලි හතරැස් කොටුවලට කපා එයද එක්කර හොඳින් කළවම් කරගන්න. ශීතකරණයක ඇසුරුවහොත් ටික දිනක් තබාගත හැකිය.

♦ ***සුරමත්‍යා ද සිල්වා*** **Colombo, Sri Lanka**

*ඔබ දන්නා අළුත් කෑම වට්ටෝරු ඇත්නම් ඒවා අපට ලියා එවන්න.*

Sam's CHICKEN CHICKEN CHICKEN
සැම්ස් චිකන්
Great Tasting! Great Value!
17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432